# නාගරික සංවර්ධන අධිකාරිය

# තිරසර පුරවර

ත්‍රෛමාසික පුවත් සඟරාව

**05 වෙළුම  2018 අප්‍රේල් - ජූනි කලාපය**

## කොළඹ මූල්‍ය සහ අගනගර සැළසුම

2018 - 2030 කොළඹ මූල්‍ය සහ අගනගර සැළසුම නොබෝදා සභාපතිතුමන් සහ අධ්‍යක්ෂ ජෙනරාල්තුමන් වෙත බස්නාහිර පළාත් අංශය සමග පර්යේෂණ සංවර්ධන සැලසුම් අංශය එක්ව ඉදිරිපත් කරනු ලැබීය.බස්නාහිර පළාත් අංශයේ අධ්‍යක්ෂ ජනත් රණවීර සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (සැලසුම්) රණතුංග මහතුන්ගේ මග පෙන්වීම ඔස්සේ මෙම සැලසුම නිර්මාණය කරණු ලැබූ අතර සභාපතිතුමන්ගේ සහ අධ්‍යක්ෂ ජෙනරාල්තුමන්ගේ උපදේශනයන් සැළසුම උසස් මට්ටමට පමුණුවාලීමට මහෝපකාරී විය.

එහි කොළඹ මහා නගර සැළසුම සඳහා විශෘත තේමාව සේ සලකනු ලැබුවේ “City in Water”වන අතර එම දැක්මෙන් අත්පත් කිරීමට අපේක්ෂා කරන්නේ කලාපයේ දැවැන්තම ආයෝජන අකර්ෂණයයි.

සැලැස්ම සඳහා සංකල්ප 6 ඔස්සේ අවධානය යොමුකරන ලදී.

කැළණි ගඟ මැදිකරගත් සංවර්ධනය, බේරේ සහ වරාය නගරය ආශ්‍රිත සංවර්ධනය, සමුද්‍රීය කලාපීය සංවර්ධනය, අභ්‍යන්තර ඇළ මාර්ග ආශ්‍රිත පුණර්ජීවනය වන ප්‍රදේශ වල සංවර්ධනය, කුරුදුවත්ත ආශ්‍රිත අඩුඝනත්ව හරිත සංවර්ධන කළාපය, බොල්ගොඩ ගඟ ආශ්‍රිත හරිත සංවර්ධන කළාපය යන මූලික සංකල්ප මෙයට ඇතුළත්ය.

ඝණත්වය (Density) මත පදනම්වූ කලාපීය නවීන නගර සැළැස්මක් මේ මගින් දායාද වන අතර එය නාගරික රටාව “Urban Foam” නිසි ලෙස අනුගමණය කළ සැළැස්මක් වනු නොඅනුමානය.

**3 වැනි පිටුවට...**







## මහජන ජංගම සේවය

**නාගරික සංවර්ධන අධිකාරියේ 40 වන සංවත්සරයට සමගාමීව සංවිධානය කරන ලද ප්‍රථම මහජන ජංගම සේවාව ජුනි මස 18 දින උදේ 10.00 ට කොළඹ 07, නිදහස් ආකේඩ් පරිශ්‍රයේදී මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි**

මෙම ජංගම සේවය සවස 6.00 දක්වා පැවැත්වීමට සංවිධානය කර තිබූ අතර ගොඩනැගිලි ඉදිකිරීම්, ඉඩම් අනු කොටස්වලට බෙදීම් හා සම්බන්ධ අනුමැතිය ලබාදීම, මූලික සැලසුම් නිරාකරණ සහතික සහ අනුකූලතා සහතික නිකුත් කිරීම, ඉඩම් සංවර්ධනය ඇතුළු සංවර්ධන බලපත්‍රවලට අදාල ගැටළු රැසකට සාකච්ඡා කොට විසදුම් ලබාදීම ප්‍රධාන අරමුණ විය.

ඉහත කී සංවර්ධන කටයුතු පෙරසැරිකර බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය නව ලොවට ගැලපෙන අයුරින් ඉලෙක්ට්‍රෝනික ක්‍රමයට, අන්තර්ජාලය හරහා ලබාදීමට නාගරික සංවර්ධන අධිකාරිය මේ වන විටත් පියවර ගෙන ඇත. මෙම අන්තර්ජාල ක්‍රමය තුළින් ලෝකයේ ඕනෑම ස්ථානයක සිට සංවර්ධන අයදුම්පත් ඉදිරිපත් කර බලපත්‍රයක් ලබාගැනී-මේ හැකියාව මහජනයාට ලබාදී ඇති අතර එමගින්
ඉතා කඩිනම් හා පුළුල් සේවාවාක් ලබාදීම අධිකාරියේ අරමුණ වී ඇත.

නාගරික සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලබන ප්‍රදේශයන්හි ආර්ථික, සමාජ හා භෞතික සංවර්ධනය ඒකාබද්ධව සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 1978 අංක 41 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කරනු ලබන නාගරික සංවර්ධන අධිකාරිය මෙරට නාගරික සංවර්ධනයේ සුවිශේෂී කාර්ය භාරයක් ඉටුකරමින් සිටී. නාගරික සංවර්ධන ක්‍රියාවලියේදී විධිමත් සංවර්ධන සැළසුම් සකස් කොට ප්‍රාග්ධන ආයෝජන සැළසුම් කිරීම, රජය විධිමත් අනුමත විසල් සංවර්ධන ව්‍යාපෘති, නාගරික ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් ගෙන යන දැවැන්ත ක්‍රියාවලිය තුළ නාගරික ප්‍රජාවගේ ඉදිකිරීම්, ඉඩම් සංර්ධනය කිරීම් ආදී නාගරික සංවර්ධන අධිකාරිය හා අනෙකුත් ආයතන හා සබැඳි ගැටළු සඳහා කඩිනමින් විසඳුම් ලබාදීම අත්‍යාවශ්‍ය කරුණකි. එය ජනතාවගේ ජීවිතයට මෙන්ම ඔවුන් මතු පරපුරට කරන්නාවූ තිරසර මෙහෙයකි.

දිනෙන් දින නාගරික පරිසරයක් තුළ උද්ගත වන ගැටළු සඳහා විසඳුම් ලබාදීම නීතිරීති අණපනත් හා බැඳුනු සංවර්ධන ක්‍රියාවලියකි. යම් අවස්ථාවක නාගරික සංවර්ධන අධිකාරිය විසින් සෘජුව ක්‍රියාත්මක නාගරික ප්‍රජාව වෙත විසඳුම් ලබාදීමට හැකිවුවද, තවත් අවස්ථාවක අධිකාරිය පමණක් නොව අනෙකුත් රාජ්‍ය ආයතනයන්ගේද නීතිරීති වලට අනුකූලව ක්‍රියාත්මක විය යුතුය. මෙවැනි ගැටළු අවම කිරීම සඳහා ජනතාව අධිකාරිය වෙත පැමිණීම වෙනුවට අධිකාරිය ජනතාව වෙත ගොස් ගැටළු විසඳීමේ ප්‍රායෝගික වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා නාගරික සංවර්ධන අධිකාරියට ලබා දී තිබූ උපදෙස් අනුව මෙම ජංගම සේවය පවත්වන ලදී.

මේ අනුව, කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 13 නියෝජනය කරමින් වගකිව යුතු නිලධාරීන් මෙන්ම අනෙකුත් ප්‍රධාන රාජ්‍ය ආයතන වන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, විදුලිබල මණ්ඩලය, මධ්‍යම පරිසර අධිකාරිය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, වෙරළ සංරක්ෂණ අධිකාරිය, වාර්මාරිග දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල නියෝජනය කරන නිලධාරීන් ඇතුලු නිලධාරීන් මෙම අවස්ථාවට එක්විය. මේ අනුව වසර ගණනක් පුරා ඉහත ආයතනයන්හි සහතිකයන්, අනුමැතියන් ලබා ගත නොහැකිව සිටින කොළඹ දිස්ත්‍රික් ජනතාවට එකම වහලක් යටදී ඉහත ආයතනයන් සමග සම්බන්ධ වෙමින් තම ගැටළු සාකච්ඡා කොට විසඳුම් ලබා ගැනීමට හැකිවිය .

**3 වැනි පිටුවට...**





## මිහිඳුසෙන්පුර හා සිරිමුතු උයන මහල් නිවාසවල මැහුම් පාඨමාලාවේ සහතිකපත් ප්‍රධානය

මිහිඳුසෙන්පුර හා සිරිමුතු උයන මහල් නිවාසවල ස්වයං රැකියා සඳහා කැමති කාන්තාවන් වෙනුවෙන් පවත්වනු ලැබූ සය මාසික මැහුම් පාඨමාලාවේ සහතික පත්‍ර ප්‍රදානෝත්සවය සිරිමුතු උයන මහල් නිවාසයේ දී 2018 අප්‍රේල් මස 02 වන සඳුදා දින පවත්වන ලදී.

## නාගරික සංවර්ධන අධිකාරිය - නව බඳවා ගැනීම්

නාගරික සංවර්ධන අධිකාරිය විවිධ අංශ ගණනාවකින් සමන්විත වේ. එහි බඳවා ගැනීම් වලට අදාළ සියලු කටයුතු මානව සම්පත් කළමනාකරණ අංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

2018 වර්ෂයේ II වන කාර්තුව තුළ එනම් අප්‍රේල් සිට ජුනි දක්වා කාලය තුළ විවිධ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකර ඇත.

| | | |
|---|---|---|
| ආරක්ෂක නියාමක | - ස්ථිර පත්වීම් | - 67 |
| ගිණුම් ලිපිකරු | - ස්ථිර පත්වීම් | - 03 |
| ගෘහ නිර්මාණ ශිල්පී | - ස්ථිර පත්වීම් | - 04 |
| සහකාර පාරිසරික සැලසුම් නිලධාරී | - ස්ථිර පත්වීම් | - 03 |
| සැලසුම් සහකාර | - ස්ථිර පත්වීම් | - 01 |
| කම්කරු | - ස්ථිර පත්වීම | - 01 |
| සැලසුම් සහකාර | - කොන්ත්‍රාත් පදනම මත | - 02 |
| සැලසුම් ශිල්පී | - කොන්ත්‍රාත් පදනම මත | - 02 |
| සහකාර ආරක්ෂක කළමණාකරු | - කොන්ත්‍රාත් පදනම මත | - 01 |
| සැලසුම් ශිල්පී | - කාර්ය පැවරුම් මත | - 05 |
| ලිපිකරු | - කාරුය පැවරුම් මත | - 01 |
| ගෘහ නිර්මාණ ශිල්පී | - කාර්ය පැවරුම් මත | - 01 |

මෙයට අමතරව නාගරික ආයෝජන පුද්ගලික සමාගම (UNDEP) යටතේ පහත බඳවා ගැනීම් සිදුකර ඇත.

| | | |
|---|---|---|
| සහකාර සැලසුම් නිලධාරී | - කොන්ත්‍රාත් | - 19 |

අදාළ බඳවා ගැනීම් සිදු කිරීමේදී ඔහු වෙත පුහුණු වැඩ සටහන්ද ක්‍රියාත්මක කරනු ලැබේ. උදාහරණ ලෙස ගතහොත් ආරක්ෂක නියාමකයින් සේවයට බඳවා ගෙන දින දහයක පුහුණු වීමක් එනම් ගිණි අවි පුහුණුව/ ආරක්ෂාව යන කරුණු පදනම්කරගෙන ශ්‍රී ලංකා යුධ හමුදාව, නාවික හමුදාව හා ගුවන් හමුදාවේ බලයලත් නිලධාරීන් යොදා විධිමත් පුහුණුවක් ලබාදෙන ලදී



## ගරු අමාත්‍යතුමන් ගෙන් නව ආරක්ෂක නිලධාරීන් පත්වීම් ලබාගත් අවස්ථාව ....

නොබෝදා නාගරික සංවර්ධන අධිකාරියේ ආරක්ෂක අංශය වෙත සේවකයන් 67 දෙනකු බඳවා ගනු ලැබීය.මේ අනුව අඩුපාඩුවක්ව පැවති ආරක්ෂක නියාමක වරුන් ප්‍රමාණවත් පරිදි අනුයුක්ත වීම නිසා අධිකාරියේ වත්කම් කළමනාකරණ කටයුතු බොහෝසෙයින් ක්‍රමවත් වනු ඇත..

## නවක නිලධාරීන් සඳහා වූ වැඩමුළුව

පසුගිය ජුනි මස 22 සිට 25 යන කාලය තුල මානව සම්පත් කළමනාකරණ අංශය විසින් මෑතකදී බඳවා ගනු ලැබූ නවක නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩමුළුවක් තුල්හිරිය MAS පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වනු ලැබුවා.

නිලධාරීන් 80 දෙනකු මේ සඳහා සහභාගී වූ අතර අධිකාරියේ සියලුම අංශවල අධ්‍යක්ෂක වරුන් විසින් එක් එක් අංශයන් විසින් සිදුකරණ කාර්යන් පිළිබඳව සවිස්තරාත්මක දේශණයන් පවත්වනු ලැබීය.

## ලෝක ප්‍රවීනයන්ගේ මළල ක්‍රීඩා තරඟාවලියට සුදුසුකම් ලබා...



සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී 2018 ජුනි මස 02 සහ 03 වන දිනයන්හි පැවති ප්‍රවීනයන්ගේ මළල ක්‍රීඩා තරඟාවලියේදී තුන්පිම්ම ඉසව්වෙන් දෙවන ස්ථානය දිනාගත් වජිරා ජාගොඩ ආරච්චි මිය සහ කි.මී. 05 ඇවිදීම තරඟයෙන් තුන්වන ස්ථානය දිනාගත් පී.එස්.පී.වාසුදේව මහතා 2018 සැප්තැම්බර් මස ස්පාඤ්ඤයේදී පැවැත්වෙන ලෝක ප්‍රවීනයන්ගේ මළල ක්‍රීඩා තරඟාවලියට මෙම අධිකාරිය නියෝජනය කරමින් සහභාගීවීමට නියමිතය. ඔවුන් දෙපළට නාගරික සංවර්ධන අධිකාරියේ සුභාශිංසන .

## සංස්කාරක සටහන

### ජංගම සේවය.....නවමු විසඳුම් මාවතක්

ජනතා අවශ්‍යතා ඉටුකිරීම සඳහා ජංගම සේවාවන් පැවැත්වීම රාජ්‍ය අංශයේ දුලභ සිදුවීමක් නොවේ. එහෙත් නාගරික සංවර්ධන විෂයෙහි එබඳු කටයුත්තක් ඉටුකිරීම අතිශය සංකීර්ණ කටයුත්තක් වන්නේ කාලයක් පමාවූ හෝ රාජකාරිමය වශයෙන් ඉටුකළ නොහැකි සාධාරණ හේතු ගණනාවකින් සමන්විත වුත් ඉල්ලීම් රැගෙන පැමිණෙන ජනතාව වෙනුවෙන් පොදු වේදිකාවක් සකස් කිරීමයි.
මෙහිලා වඩාත්ම අභියෝගාත්මක වන්නේ නොවිසඳුණු සහ ඉටුකරවා ගැනීමට අපොහොසත්වූ ඉල්ලීම් සමග ආපසු යන පාරිභෝගිකයන්
සෙසු ජනතාව තුල නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් පොදුවේ ඇති කරන්නාවූ කලකිරවීමයි.

ඒ අර්ථයෙන් ගත් කල ජුනි මස 18 දින පවත්වනු ලැබූ නාගරික සංවර්ධන අධිකාරියේ ජංගම සේවාව අර්ථාන්විත වූ බව නිරීක්ෂණය කල හැකි විය.

බලාත්මක අංශය  බස්නාහිර පළාත් අංශය යන අංශයන් මූලික කරගෙන අනෙකුත් අංශයන්ද ඇතුළුව පැවැත්වුනු මෙම සේවාවෙන් සේවා අපේක්ෂාවෙන් 350 පිරිසක් පැමිණුනු අතර බලාත්මක අංශය ඔවුන් වෙත සේවා අපේක්ෂාවෙන් පැමිණි 198 වූ පිරිසෙන් 107දෙනකු වෙත බලපත්‍ර සහ අනුමැතිය ලබා දීමට හැකියාව ලැබිණි. බස්නාහිර පළාත් අංශය වෙත යොමුවූ 67 දෙනකු අතුරින් 25 දෙනකු වෙනුවෙන් විසඳුම් ලබා දීමට හැකියාව ලැබිණි.

අත්කරගත් සාර්ථක ප්‍රතිපලය නිසාම මෙවැනි ජංගම සේවාවවන් ඉදිරියේදී අනෙකුත් ප්‍රධාන නගර අරභයා සිදුකිරීමට ගරු අමාත්‍යයතුමන් ගත් තීරණය ප්‍රශංසනීය වේ.

**මහජන ජංගම සේවය...**

**1 වැනි පිටුවෙන්...**

නාගරික සංවර්ධනය හා රටක සංවර්ධනය එකිනෙක බැඳී පවතින්නකි. එම ආයෝජනය ජය ගැනීමට නම් පුරවැසියාගේ අභිවෘද්ධිය අත්‍යාවශ්‍ය සාධකයකි. ඔවුන්ගේ ජීවිතයන්හි ඉලක්කයන් කරා යාමට අවැසි ශක්තිය දුන් කල්හි නවීකරණ ප්‍රයත්නයන් තුළ වේගයෙන් නව ප්‍රවේශයක් යටතේ සංවර්ධනය වන මෙරට නාගරික පද්ධතියට  තවදුරටත් ශක්තියක් එක්වනු නොඅනුමානය.

**කොලඹ මුල්‍ය සහ අගනගර සැළසුම...**

**1 වැනි පිටුවෙන්...**




නාගරික සංවර්ධන අධිකාරිය මගින් සකස් කරන ලද කොළඹ මහ නගර සැළසුම් සංකල්පයට අනුව, එම මධ්‍ය ප්‍රදේශය කොළඹ මූල්‍ය නගරය (Colombo Financial City) සහ අග නගරය (Capital City)ලෙස කොටස් දෙකකට බෙදා වෙන්කර ගනිමින්, සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව කොළඹ මහ නගර සභාව, කොලොන්නාව ප්‍රාදේශීය සභාව, දෙහිවල-ගල්කිස්ස මහනගර සභාව, බොරලැස්ගමුව නගර සභාව, වත්තල ප්‍රාදේශීය සභාව (කොටසක්) සහ කැලණිය ප්‍රාදේශීය සභාව (කොටසක්) කොළඹ මූල්‍ය නගර සංවර්ධන සැලැස්ම යටතේ සහ ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ මහනගර සභාව, මහරගම නගර සභාව, කඩුවෙල මහනගර සභාව සහ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව අග නගර සංවර්ධන සැලැස්ම යටතේ සංවර්ධනය කිරීමට සැලසුම් කොට ඇත.

ඒ අනුව මූල්‍ය නගර සංවර්ධනය සඳහා  “Regalian Diadem of the Ceylon” යන සන්නාමයෙන් යුක්ත වු එහි දැක්ම වුයේ, “තෙත්බිම් තුළින් මතුවන ලාංකික රාජධානියේ නම්‍ය පුනරාගමනය” යන්නයි. නව නිර්මාණකරණ මූලධර්ම  පදනම් කරගෙන ගොඩනැගූ මෙම සැලැස්මෙහි විශේෂ හැරවුම් ලක්ෂ ලෙස ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණය, කැලණි විහාරය සමඟ ඒකරේඛීය වන ආකාරයට  පිහිටුවා ප්‍රධාන අක්ෂයක් නිර්මාණය කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම ව්‍යස්ථාදායකය, විධායකය, තානාපති කාර්යාල සහ දියවන්නා ඔය ඒකාබද්ධ කරගත් රාජකීය උද්‍යානයකින් සමන්විත අගනගරයේ ප්‍රධාන මධ්‍යයක්ද සියලුම පරිපාලන ආයතන සහ ප්‍රභූ නේවාසික ඇතුළත නගරයක්ද, වාණිජ නගරය සිට නුවර ලෙසද ගොඩනැඟීම සඳහා යෝජනා කර ඇත. තවද, පවතින්නා වු තෙත් බිම් නව මුහුණුවරකින් සංවර්ධන සංකල්පයක් අනුව, සංවර්ධනය කිරීම සඳහා සැලසුම් කොට ඇත. (Wise Use of Wetland)

## සෙත්සිරිපාය තෙවන අදියර ඉදිකිරීම් ඇරඹේ.

මෙහනගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යංශයේ මහා නගර සැලැස්මේ පුරෝකථන අනුව සහ ප්‍රධාන පරිපාලන නගරය බත්තරමුල්ලට ගෙන ඒමේ සැලැස්මට අනුකූලව රජයේ කාර්යාල සඳහා ඉඩකඩ ලබාගැනීමේ අවශ්‍යතාවය ඉහළ යමින් පවතී. මෙම අවශ්‍යතාවයට සරිළන පරිදි නාගරික සංවර්ධන අධිකාරිය සිය සෙත්සිරිපාය අදියර III  ඉදිකිරීමට නොබෝදා  මුල්ගල තබනු ලැබුවේ ගරු කථානායක කරු ජයසූරිය මැතිදුන්ගේ ප්‍රධානත්වයෙනි.

වර්තමාන සෙත්සිරිපාය සහ වෝටර්ස් එජ් ආයතන අතරින් පවතින අක්කර 4.4 වපසරියකින් යුතු අධිකාරිය සතු ඉඩම මේ ඉදිකිරීම සඳහා යොදවාගනු ලැබේ . ඉදිකරණු ලබන ගොඩනැගිල්ල මහල් 25 කින් සහ වර්ග අඩි 1,359,439 කින් යුක්ත වනු ඇත.

මෙම ගොඩනැගිල්ල බිම් මට්ටමේදී වර්ග අඩි 73,802.84 වපසරියක් වසා පැතිර පවතිනු ඇත .සියළු නවීන අංගෝපාංග වලින් සමන්විත මෙම ඉදිකිරීම තුළ වාහන 700 එකවර නවතා තැබීමට හැකියාවෙන් ද යුක්ත වනු ඇත.
එක්වර 7500 ක පිරිසකට කාර්යාල පහසුකම් මේ මගින් ලබා දීමට ද අපේක්ෂිතයි.

වර්තමාන ගෘහ නිර්මාණ ශිල්පයේ අපූර්ව නිර්මාණයක් වීමට අවශ්‍ය සියළු අවශ්‍යතා මෙම ඉදිකිරීම සපුරාලනු ලබන්නේ නීල-හරිත ගොඩනැගිලි  උපදෙස් සහ චක්‍රලේඛ ඉහළින්ම  අනුගමණය කරණු ලැබීමෙනි .










## ජූනි 22

පසුගිය ජූනි මස 22 සිට  25 යන කාලය තුල මානව සම්පත් කළමනාකරණ අංශය විසින් මෑතකදී බඳවා ගනු ලැබූ නවක නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩමුළුවක් තුල්හිරිය ඒ පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වනු ලැබුවා. නිලධාරීන් 80 දෙනකු මේ සඳහා සහභාගී වූ අතර අධිකාරියේ සියලුම අංශවල අධ්‍යක්ෂක වරුන් විසින් එක් එක් අංශයන් විසින් සිදුකරණ කාර්යන් පිළිබඳව සවිස්තරාත්මක දේශණයන් පවත්වනු ලැබීය.

## ජූනි 20

නාගරික සංවර්ධන අධිකාරියේ මානව සම්පත් කළමනාකරණ අංශය මගින් මහරගම අපේක්ෂා රෝහල වෙත තැඹිලි ගෙඩි දහසක් සහ දෙළුම් ගෙඩි දහසක් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පසුගියදා අධ්‍යක්ෂිකා දේවිකා කැකුලන්දර මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

## ජූනි 18

නාගරික සංවර්ධන අධිකාරියේ 40 වන සංවත්සරයට සමගාමීව සංවිධානය කරනු ලබන මහජන ජංගම සේවාව උදේ 10.00 ට කොළඹ 07, නිදහස් ආකේඩ් පරිශ්‍රයේදී මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කෙරුණි.

## ජූනි 12

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ කොළඹ අගනගර ආශ්‍රිත මහනගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලෝක බැංකු ආධාර මත නාගරික සංවර්ධන අධිකාරියේ මෙහෙයවීමෙන් ඉදිකරන ලද බේරේ වැව ජෛවිය උද්‍යානය (නැගෙනහිර බේරේ, නැගෙනහිර ඉවුර) ජනතා අයිතියට පත් කිරීම අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ආරාධනයෙන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ බේරේ වැව අසලදී සිදු විය



## ජූනි 01

මධ්‍යම පළාත් මහනගර සැලසුමට අනුව මහනගර අමාත්‍යංශය මගින් පරිපාලිත උපාය මාර්ගික නගර සැලසුම් ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන මහනුවර භූගත වැසිජල උමං මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ කිරීම සහ බෝගම්බර අන්තර්වාර බස් පර්යන්තය ඉදිකිරීම් ආරම්භ කිරීම අද දින මහනගර අමාත්‍ය චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරුණි.

## ජූනි 01

නුවර ගණදෙවි කෝවිල භූමියෙ පිහිටි අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම පිළිබද සාකච්චාවකට මහනගර ඇමති චම්පික රණවක මැතිතුමා එක්විය. මෙහිදී අනවසර ඉදිකිරීම් කඩිනමින් ඉවත් කිරීමට අවශ්‍ය උපදෙස් අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන අධිකාරියට ලබාදෙන ලදී. මෙම අවස්ථාවට මහනගර අමාත්‍යංශ අතිරේක ලේකම් මාධව වෛද්‍යරත්න, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති ආචාර්ය ජගත් මුණසිංහ, අමාත්‍යතුමාගේ මහනුවර සම්බන්ධීකාරක තුෂාර ස්වර්ණතිලක යන නිලධාරීන්ද මෙම අවස්ථාවට එක්විය.

## ජූනි 01

කුරුණෑගල වැව සංවර්ධනය පිළිබඳ සොයා බැලීමේ නිරීක්ෂණ චාරිකාවකට මහනගර ඇමති චම්පික රණවක මැතිතුමා සහභාගී විය. නාගරික සංවර්ධන අධිකාරිය මෙහි සංවර්ධන කටයුතු සිදු කරන අතර මෙම සංවර්ධන කටයුතු කඩිනමින් නිම කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ද අමාත්‍යවරයා විසින් මෙහිදී ලබාදෙන ලදි.

## ජූනි 01

රුපියල් මිලියන 36 ක වියදමින් මහනුවර අංකුඹුර බස්නැවතුම්පල ඉදිකිරීම් කටයුතු අද දින ඇරඹිනි. මහනගර ඇමති චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භ වූ අතර මෙම අවස්ථාවට තැපැල් අමාත්‍ය ඒ.එච්.එම්. හලීම්, මධ්‍යම පළාත් ප්‍රවාහන අමාත්‍ය එදිරිවීර වීරවර්ධන මහත්වරුන් ඇතුළු පිරිසක් සහභාගී වූහ. නාගරික සංවර්ධන අධිකාරිය සහ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි.

## මැයි 31

නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන හෙට්ටිපොල මහජන පොළ ඉදිකිරීම් කටයුතු මහනගර ඇමති චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඇරඹිනි. රුපියල් මිලියන 135 කින් ඉදිවන මෙහි ඉදිකිරීම් කටයුතු 2019 වසරේ අවසන් කිරීමට නියමිතයි. මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකර මහතා ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

## මැයි 24

හේනමුල්ල ඉදිකරන ලද නිවාස ඒකක 722 කින් සමන්විත මෙත්සඳ සෙවණ මහල් නිවාස සංකීර්ණය අද දින ජනතා අයිතියට පත් කෙරිණි. ඒ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රානත්වයෙනි. මෙම මහල් නිවාස සංකීර්ණයේ කොළඹ 14 බ්ලූමෙන්ඩල් 87 වත්ත, මාදම්පිටිය 318 වත්ත ජනාවාසයේ වත්මන් පදිංචි කරුවන් සහ කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘති නිසා අවතැන්වන පවුල් එම නිවාසවල පදිංචි කරවීමට සැලසුම් කර ඇත.

## මැයි 19

නාගරික සංවර්ධන අධිකාරියේ 2018 සිට 2022 දක්වා ක්‍රියාත්මකවන ආයතනික උපායමාර්ගික සැලසුම පිළිබඳව දැනුවත් කිරීමේ සැසියක් මහනගර ඇමති චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධාත්වයෙන් කටුනායක GATEWAY හෝටලයේදී පැවැත්විණි.

## මැයි 10

රුපියල් ලක්ෂ 17,480ක ආයෝජනයෙන් දෙමටගොඩ ඉදි වූ "සියපත් සෙවන" මහල් නිවාස ව්‍යාපෘතිය පළමු අදියරේ නිවාස ඒකක 437ක් අද දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනතා අයිතියට පැවරිනි.

## මැයි 05

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශය මගින් පරිපාලිත නාගරික සංවර්ධන අධිකාරිය සහ කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය නිරීක්ෂණය කිරීමේ චාරිකාවට මහනගර ඇමති චම්පික රණවක මැතිතුමා එක්විය. එහි දී ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරීම සඳහා අදාළ උපදෙස් නිලධාරීන් වෙත ලබාදීම ද මෙහි දී සිදු විය.



## මැයි 01

නාගරික සංවර්ධන අධිකාරියේ බෞද්ධ සංගමය විසින් වෙසක්පුර පසලොස්වක පොහොය දිනය වෙනුවෙන් වාර්ෂිකව සංවිධානය කරන ධර්ම දේශනාමය පිංකම මැයි 01 දින නාගරික සංවර්ධන අධිකාරියේදී පැවැත්විණි. බම්බලපිටිය වජිරාරාම වාසී මීගොඩ සුබිත හිමියන් විසින් සුමධුර වූ ධර්ම දේශනාව පවත්වන ලදි.

## නා.සං.අ නිදහස් සේවක සංගමයේ වාර්ෂික බත් දන්සැල සහ සාංඝික දානමය පුණ්‍යකර්මය

ජූනි මස 29 දින  දවස පුරා සෙත්සිරිපාය පරිශ්‍රයේදී නාගරික සංවර්ධන අධිකාරියේ නිදහස් සේවක සංගමයේ වාර්ෂික බත් දන්සැල අති සාර්ථක ලෙස පවත්වන ලදී. මහා සංඝයා විෂයෙහි සාංඝික දානමය පුණ්‍ය කර්මයක්ද මේයට සමගාමීව පවත්වනු ලැබීය. නාගරික සංවර්ධන අධිකාරියේ රියදුරු සංගමය සිය නොමසුරු ශ්‍රම දායකත්වය මෙවරද මෙම පුණ්‍ය කර්මය සඳහා ලබාදෙනු ලැබීය. නිදහස් සේවක සංගමයේ සභාපතිතුමන් සමන්ත නවරත්න, ලේකම්තුමන් චන්ද්‍රසිරි බේරුවලගේ සහ කාරක සභාව ඉමහත් කැපවීමෙන් යුක්තව මෙය සංවිධානයෙහි ලා මහත් සේ කැපවීමෙන් කටයුතු කරන ලදී. දන්සැල සඳහා 3000 කට අධික පිරිසක් ආහාර පාන ලබාගත් බව සංවිධායක මණ්ඩලය සතුටින් දැනුම් දෙන ලදී.

මේ සඳහා නොමසුරුව නන් අයුරින් දායක වූ අධිකාරියේ කාර්ය මණ්ඩලයටත්, සෙසු බාහිර දානපතියන්ටත් නිදහස් සේවක සංගමය සිය පුණ්‍යානුමෝදනාත්මකව සිය ස්තූතිය පිරිනමනු ලබයි. ලබන වර්ෂයේත් මීට වඩා උසස් අයුරින් මෙම වාර්ෂික පුණ්‍ය කර්මය පැවැත්වීමට ඔවුන් අපේක්ෂා කරයි.





## බේරේ වැව සංවර්ධන සැලසුම

බේරේ වැව සංවර්ධන සැලසුම යටතේ හඳුනාගත් ව්‍යාපෘතියක් වන බේරේ වැව රක්ෂිතය පොදු මහජනතාව සඳහා විවෘතකර ඒ වටා ඇති සංවර්ධනය සඳහා යොදාගත හැකි ඉඩම් සඳහා වැඩි වටිනාකමක් ලබාදී ප්‍රශස්ත භාවිතයකට යොදාගැනීම ප්‍රධාන අරමුණු අතර වේ.

ඊට අමතරව සෘජුවම බේරේ වැවෙහි ජල දූෂණයට හේතුවන මළාපවහන හා අනෙකුත් අපද්‍රව්‍ය එකතුවීම වැලැක්වීමට මේ අනුව හැකිවනවා ඇත.



ඒ අනුව නැගෙනහිර බේරේ නැගෙනහිර ඉවුර කි.මී. 2.5 ක පමණ ඉවුරු සංරක්ෂණය කර රේඛීය උද්‍යානය ඉදිකිරීම සඳහා රු. මිලියන 640 ක් වැය කරන ලදී.

මේ සඳහා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය හරහා ලෝක බැංකුව මූල්‍යමය ප්‍රතිපාදන සපයා ඇත.

මෙසේ ඉදිකිරීම් නිමකරන ලද බේරේ වැව රේඛීය උද්‍යානය ජනතා අයිතියට පත්කිරීම මහානගර හා බස්නාහිර සංවර්ධන ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ආරාධනයෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් 2018 ජූනි මස 12 වන දින සිදුකරන ලදී.

මෙම රේඛීය උද්‍යානය කුඩා දරුවාගේ සිට වැඩිහිටි පුද්ගලයා දක්වා තම විවේක කාලය ගතකල හැකි පරිදි නිම කර ඇති අතර ළමා ක්‍රීඩාංගනයක්, විවේකීව ගතකල හැකි ස්ථාන, කුඩා වෙළඳසැල්, අවන්හල් සහ සනීපාරක්ෂක පහසුකම් ද ඇවිදීම සහ පාපැදියෙන් ගමන් කිරීම සඳහා පහසුකම් ද සපයා ඇත.

බටහිර බේරේ නැගෙනහිර සහ බටහිර ඉවුර සංරක්ෂණය නිමකර ඇති අතර බටහිර ඉවුර රේඛීය උද්‍යානය (කි.මී. 1.2) ඉදිකිරීම් මේ වන විට ආරම්භකර ඇති අතර 2019 වසර මැද භාගය වන විට මෙහි ඉදිකිරීම් කටයුතු නිමකිරීමට අපේක්ෂිතය. ලෝක බැංකු ආධාර මත මෙම ව්‍යාපෘතිය ද ක්‍රියාත්මක වන අතර මෙහි නිමකිරීම් ප්‍රදේශයේ ක්‍රියාත්මක වන මහාපරිමාණ ව්‍යාපෘතීන්ට ගැලපෙන අයුරින් සැලසුම්කර ඇත. මේ සඳහා රු.මිලියන 150 ක් පමණ වැය කිරීමට අපේක්ෂිතය.



## ලිපිගොනු පද්ධති ගත කිරීමේ ප්‍රගති සටහන...

ගරු අමාත්‍යතුමන් හට යොමුකරනු ලබන සියළුම ලිපි හා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලැබෙන්නාවූ ලිපි පද්ධති ගත කිරීමට ක්‍රියාවලියෙහි දෙවන කාර්තුවේ ප්‍රගතිය පිළිබඳ සටහන පසෙකින් දැක්වේ. මේහිදී මෙම ක්‍රියාවලිය සාර්ථක අන්දමින් නාගරික සංවර්ධන අධිකාරියෙහි අංශයන් 15ක දැනට ක්‍රියාත්මක වන අතර, ලිපිගොනු පද්ධති ගත කිරීමේ ක්‍රියාවලිය අනෙකුත් සියලුම අංශයන්හිද ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වේ.මේ අනුව කාර්තුව තුල ලැබුණු මුළු ලිපි ඉල්ලීම් සංඛ්‍යාව 8334 වන අතර ඉන් 7582 ඉල්ලීම් සඳහා විසඳුම් ලබා දී ඇති අතර 752 එක් එක් අංශ මගින් මේ වන විට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතී.

| NO | DIVISION | April | MAY | JUNE | TOTAL | COMPLETED | IN PROCCES |
|---|---|---|---|---|---|---|---|
| 1 | HRM | 1533 | 1375 | 206 | 3114 | 3114 | 0 |
| | | | | | | | |
| | | | | | | | |
| 2 | CHAIRMAN OFFICE | 328 | 320 | 475 | 1123 | 1123 | 0 |
| 3 | DG OFFICE | 575 | 390 | 333 | 1298 | 1298 | 0 |
| 4 | WD OFFICE | 30 | 20 | 6 | 56 | 56 | 0 |
| 5 | LEGAL | 220 | 250 | 289 | 759 | 534 | 225 |
| 6 | LAND | 140 | 180 | 120 | 440 | 253 | 187 |
| 7 | ENGINEERING | 37 | 25 | 55 | 117 | 29 | 88 |
| 8 | PPM&R | 97 | 112 | 116 | 325 | 245 | 80 |
| 9 | GIS | 20 | 14 | 7 | 41 | 37 | 4 |
| 10 | ADDG OFFICE | 80 | 65 | 77 | 222 | 202 | 20 |
| 11 | PROCUMENT | 35 | 42 | 40 | 117 | 105 | 12 |
| 12 | MIDDLE INCOME | 18 | 29 | 20 | 67 | 47 | 20 |
| 13 | WESTERN PROVINCE | 80 | 105 | 50 | 235 | 205 | 30 |
| 14 | ENFORCEMENT AUD & MONI | 48 | 37 | 31 | 351 | 314 | 37 |
| 15 | DDG PLANNING | 27 | 32 | 10 | 69 | 20 | 40 |
| | | | | | 8334 | 7582 | 752 |

**නාගරික සංවර්ධන සභාපති ආචාර්ය ජගත් මුණසිංහ මහතා විසින් උදාකරදුන් අවස්ථාවක් අනුව ඉන්දියාවේ අහමදාබාද් නිර්මා විශ්වවිද්‍යාලයේ ගෘහ නිර්මාණ හා සැලසුම්කරණ සිසුවියන් කණ්ඩායමක් අධ්‍යයන චාරිකාවක නිරත වුණා. මේ ඔවුන් සිය අත්දැකීම් අපට පැවසූ අයුරුයි..**



ZEEL PATEL

As an Indian female student going to live and travel the whole country of Sri Lanka for two months, one month already completed I have some experience to share.

First of all, as a woman I can feel the ease and joy with which I can traverse public places in public transport, if this had been in India there would be many difficulties and a sense of insecurity. The second most striking thing that I noticed is how the tourists' spots and public spaces are so unreasonably clean. India also has its fair share of public spaces and tourist attractions but cleanliness not so good. The third unique feature is that how the poverty is less in your face and how you are not weighed upon by the population pressure unlike India.

That being said, there are always two sides of a coin other equally as important. Sri Lanka reminds me of few parts of India with coconut trees, general relaxed vibes and beautiful sites but distances and travelling can be tiresome because of Sri Lanka's transport infrastructure- packed buses and unreliable, packed trains can be frustrating. On the other hand, travelling in India all across the country is very easy and very efficient with its integrated public transport facilities like Metro rail transit system, Rapid Bus transit system, Rickshaws and public bus service at local levels and domestic flights and frequent intercity/interstate trains and buses at country level.

One other thing is though Sri Lanka has places never seen before, India I feel is much more colorful and India's growing tourism industry is doing lot of work in promotion for its tourism (!ncredible India). Many of cultural sights in India are much more loud and vibrant and there are lot of things one can do but that does not mean Sri Lanka is any less, it has the potential to promote its tourism and tourism related activities because people have to know first of its mystical heritage, grandeur tea gardens and dramatic landscapes and what are things that can be done to have an unforgettable experience.



PARIDHI POKHARIYAL

## CAN DEVELOPMENT AND SUSTAINABILITY GO HAND IN HAND?

from our experience in UDA of a month we have come to realize that the aim of all the projects is directed towards the wholesome development of its people, though we also noticed that country for its development is ready to disrupt its marshy lands and wetlands.

The thing we as planners need to learn from this country about sustainability is, they provide different zoning law for every plot and parcel of land that includes; segregation and processing of waste on site, 45⁰ inclined rooftop with terrace gardens, skywalks to avoid pedestrian congestion, conserving the naturally sensitive areas with the urban areas, liberating the underused land occupied by shanties, slums and squatter settlements, developing the naturally existent water bodies for recreational and transportation purposes and the active usage of public transportation system.

This country has truly explained us about how we can plan the development of our urban areas such that every aspect of a society, community can be integrated with its surrounding environment with the minimal damage to its ecosystem. We can definitely say that in Sri Lanka is trying its best as a country to promote development and sustainability together and have successfully achieved this on many level.



KHYATI SINGH

## SRI LANKA ON WHEELS

The decision maker about public transport do not travel in them ask those who do. Arriving from flight to Colombo we had private taxi, wide road, lush green forest around the highways show a good transportation picture of the country. The inter-province expressways, A.C. buses, better connectivity, smooth roads are good for developed transportation. But when it comes to a local level, connectivity to remote area, public transport, tuk -tuk for tourist are so pathetic. That once we refuse to continue in public bus, we had get out from the bus in mid-way, because of over crowded bus. The frequency of bus is so less that after a certain time no buses are available. Overall the experience of local level transportation was not good as it seen in many other south Asian country.

But, Sri Lanka has a great potential to develop "untouched source" inland waterways. Canal water ways, sea routes, ports development etc. It can support planned improvement in rail and bus transport. Dutch history and attracting private investment with Netherland and Sri Lanka relationship -part of megapolis development. Inter connecting waterways not only enhance the beauty of canal and river but it also lower the pressure on road transportation. This can be a pathway to improve the infrastructure and service for a good transportation system.



AASHKA PATEL

## THE STATUS OF LOW INCOME HOUSING IN SRI LANKA

What struck us the most was the designing and spatial planning of the schemes. They used bright and vibrant colors, creating a very lively, cheerful and buoyant surrounding. The provision of corridors between the housing units acts as a good interactive and synergistic space between different households. Also, the provision of small courtyards helped in improvising the light and ventilation of the building, hence maximizing the thermal cooling of the building. All the standards followed in designing of the schemes were similar to the housing of the middle and higher income groups. For the social and cultural well-being and uplifting of the people, URP has introduced various social upgrading activities.

But as we studied and analyzed the schemes more deeply we found few loopholes and flaws. As the payment for the housing is done in installments over 30 years, people do not feel connected to there homes. Due to such issues the problems related to maintenance and vandalism arises. In many housing schemes there were lack of recreational and open spaces. Due to different cultural background, few social conflicts arose.

Learnings from India

There is community housing scheme known as Aranya (Indore, India) houses a population of 60000 in 6500 dwellings, on a net planning area of 85 hectares. The main features that makes this scheme unique are: houses are arranged around the open spaces, organized into 10-home clusters to create a sense of community, but each also includes a small private courtyard to the rear. Rather than completely erasing the dense urban clusters which it was meant to replace, Aranya seeks to replicate their neighborly social spaces and providing several smaller open spaces rather than one central big open space in the center becomes more effective.

# නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය - කොළඹ නගරය

කොළඹ නගරය තුළ අඩු පහසුකම් සහිත ජනාවාසවල ජීවත්වන පවුල් සඳහා නවීන පහසුකම් සහිතව ස්ථිර නිවාස ලබාදී ඔවුන්ගේ ජීවන තත්ත්වය වඩාත් උසස් මට්ටමට ගෙන ඒමේ මූලික අරමුණ පෙරදැරි කරගෙන නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මගින් නිවාස ඒකක 50,000 ක් ඉදිකිරීමේ ඉලක්කය මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමාගේ මඟ පෙන්වීම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක වේ.  නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ දැනට නිවාස ඒකක 8113 ක වැඩ අවසන් කර ජනතා අයිතියට පත්කර ඇති අතර, තවත් නිවාස ඒකක 7744 ක් දැනට ඉදිවෙමින් පවතී.

නිදන කාමර 02 කින් හා සියලු මූලික පහසුකම් සහිත මෙම නිවාස ඒකකයක ඉදිකිරීම් හා සේවා සැපයුම් සඳහා වන වියදම රු. මිලියන 4 ක් වන අතර, නිවැසියන්ගේ පහසුව පිණිස විදුලි සෝපාන, ප්‍රජා ශාලා සහ අනෙකුත් අංගෝපාංග වලින් සමන්විතය.

හේනමුල්ල, “මෙත්සඳ සෙවණ” මහල් නිවාස ව්‍යාපෘතිය නිවාස ඒකක 941කින් සමන්විත වන වන අතර නිවාස 218 සමන්විත 'ගොඩනැගිල්ල 2017.10.30 දින ජනතා අයිතියට පත් කරන ලදී. නිවාස ඒකක 722 කින් සමන්විත බ,ච සහ ද ගොඩනැගිලි  2018.05.23 වන දින ජනතා අයිතියට පත් කරන ලද අතර එම නිවාස ව්‍යාපෘතියෙහි කොළඹ 14, බ්ලූමැන්ඩල් 87 වත්ත,මාදම්පිටිය, 318 වත්ත ජනාවාසයේ වත්මන් පදිංචිකරුවන් සහ කොළඹ අග නගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය නිසා අවතැන් වන පවුල්, බේරේ වැව සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සදහා කොළඹ 02 වොක්ෂෝල් වීදිය පදිංචි පවුල්  එම නිවාසවල පදිංචි කරවීම ආරම්භ කර ඇත.

දෙමටගොඩ, ආරාමය පෙදෙස සියපත් සෙවන නිවාස සංකීරණය නිවාස ඒකක 718 කින් සමන්විත වන අතර එහි නිවාස ඒකක 437කින් සමන්විත ගොඩනැගිලි සංකීර්ණ 2018.05.10 දින ජනතා අයිතියට පත් කරන ලදී. මේට්ලන්ඩ් පෙදෙස 55 වත්ත ජනාවාසය සහ මාලිගාවත්ත දුම්රිය නිල නිවාස වල නිවැසියන්  මෙහි පදිංචි කරවීමට නියමිතය.මෙම නිවාස ව්‍යාපෘතිවල පදිංචි කිරීමට නියමිත ජනතාවගේ ප්‍රයෝජනය සදහා ගරු පාටලී චම්පික රණවක මැතිතුමාගේ පූර්ණ මැදිහත්වීම සහ නායකත්වය මත පෙරපාසල් 02ක් එදිනම ආරම්භ කල අතර නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ උපදේශක අංශයේ සෘජු දායකත්වය මත පවත්වාගෙන යනු ලැබේ.

## 2016 /2017/ 2018 වර්ෂ තුළදී ඉදිකිරීම් නිමවූ නිවාස ව්‍යාපෘති

| | | | |
|---|---|---|---|
| මුවදොර උයන | (ෆර්ගියුෂන් පාර) | - | 254 |
| සියසෙත සෙවණ | (ප්‍රදීපා මාවත) | - | 266 |
| ජයමඟ සෙවණ | (මහවත්ත) | - | 68 |
| ලක්හිරු සෙවණ | (මාළිගාවත්ත) | - | 192 |
| මෙත්සඳ සෙවණ | (හේනමුල්ල) | - | 218 |
| ලක්සඳ සෙවණ | (කොලොන්නාව) | - | 792 |
| ලක්සෙත සෙවණ | (මාලිගාවත්ත) | - | 480 |
| සියපත් සෙවණ | (දෙමටගොඩ) | - | 437 |
| මෙත්සඳ සෙවණ | (හේනමුල්ල) | - | 722 |
| **එකතුව** | - | | **3429** |






## නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ඉදිවෙමින් පවතින නිවාස ව්‍යාපෘති

| | නිවාස ව්‍යාපෘති | නිවාස ඒකක | ව්‍යාපෘතීන් සම්පූර්ණ වන දිනය |
|---|---|---|---|
| 01 | සියපත් සෙවණ, දෙමටගොඩ | 266 | 2018 ජූලි |
| 02 | අංගොඩ | 500 | 2018 ජූලි |
| 03 | මට්ටක්කුලිය 1 | 1647 | 2018 ජූලි |
| 04 | මට්ටක්කුලිය 2 | 1076 | 2018 ජූලි |
| 05 | අලුත් මාවත 1 | 576 | 2018 ජූලි |
| 06 | අලුත් මාවත 2 | 672 | 2018 ජූලි |
| 07 | මාළිගාවත්ත | 576 | 2018 දෙසැම්බර් |
| 08 | කොලොන්නාව | 696 | 2018 දෙසැම්බර් |
| 09 | කොළඹගේ මාවත, කොළඹ 05 | 615 | 2019 |
| 10 | කාලිංඝ මාවත, කොළඹ 05 | 528 | 2019 |
| 11 | ටොරින්ටන් මාවත | 120 | 2019 |
| 12 | කිඹුලා ඇල, බ්ලූමැන්ඩල් | 472 | 2019 |
| | **එකතුව** | **7744** | |








# ආයතනික උපායමාර්ගික සැලැස්ම ඉදිරිපත් කිරීමේ වැඩ මුළුව (2018- 2022)

2018 මුල් කාර්තු දෙක තුළ ලබාගත් ප්‍රතිපල අනුව ඉහළ ලකුණු මට්ටම් ලබා ගත් අංශ අතරින් Project Management & Consultancy ,සහ Land & Land Development අංශයන් ද මධ්‍යස්ථ ප්‍රතිපල ලැබූ අංශ අතරින් Planing Division, Project Management Division, URPCC Project Middle Income, IT Division, Legal Division, Finance යන අංශයන් සිටී.

ආයතනික උපායමාර්ගික සැලැස්ම (2018- 2022) ඉදිරිපත් කිරීමේ වැඩසටහනක් 2018 මැයි මස 18,19,20 යන දිනයන්හි පැවැත්විය. යේ සඳහා අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ නිලධාරීන් සහභාගි විය. මෙහිදි ප්‍රධාන අරමුණු 4ක් යටතේ කණ්ඩායේ 4 කට බෙදා ඒ ඒ කණ්ඩායමට අදාල අරමුණ යටතේ ඉදිරි වැඩපිලිවෙල සම්බන්ධව සැලැස්මක් ඉදිරිපත් කිරිම සිදුවිය.

### ප්‍රධාන අරමුණු සහ ඒ ඒ අරමුණු සඳහා ලබා දුන් පරමාර්ථ මෙසේය

**1. Planned physical development in all urban areas.**

1.1 Comprehensive development plans prepared for all declared urban areas by 2020.
1.2 Widely accessed State-of-the Art Information base and public communication network
1.2 A Strong enforcement mechanism for the implementation development plan

**2. Stimulated social and economic development in urban areas.**

2.1 Strategic Urban Development Projects Implemented in all Urban Areas
2.2 A land bank readily available to stimulate development projects
2.3 Strategic Joint Ventures formulated for Urban Development

**3. Enhanced liveability and improved quality of life in urban areas**

3.1 Stronger coordination with Infrastructure Development Agencies
3.2 Comfortable, Smart and Vibrant Public Spaces developed in all Urban areas
3.3 Conserved Unique Characteristics, Green and Environmentally Sensitive Sites in all Urban Areas

**4. Performance excellence within the organization.**

4.1 Trained, Promoted, Dedicated and Rewarded Workforce
4.2 Continuously updated and Well Geared Management system
4.3 Progressive working environment for all staff





### KPI දර්ශකයේ පසුගිය මාස කිහිපය තුල ප්‍රතිපල

මෙම උපායමාර්ග උපයෝගී කර ගනිමින් 2018 - 2022 සඳහා වු ප්‍රධාන අරමුණු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය සහය අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ හා අනෙකුත් මට්ටම් වලින් ලබාගනිමින් ඔවුන් හට මනා අවබෝධයක් හා අභියෝග කිහිපයක්ද ලබා දීම සිදුවිය.
එමඟින් 2018 - 2022 උපායමාර්ග සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ඔවුන්ගේ සහයෝගය මහත් රුකුලක් වෙමින් ඉදිරි ගමන සාර්ථක වෙනවා නොඅනුමානය.




| | Planning | Project | Consultancy | Finanance & admin | Land & Development | Under director General |
|---|---|---|---|---|---|---|
| JAN | 46% | 36% | 44% | 33% | 84% | 65% |
| FEB | 63% | 83% | 105% | 60% | 84% | 78% |
| MAR | 81% | 89% | 89% | 88% | 81% | 79% |
| APR | 79% | 66% | 90% | 80% | 75% | 86% |
| MAY | 83% | 62% | 84% | 85% | 76% | 82% |
| JUNE | | | | | | |

සංස්කරණය

ව්‍යාපාර ප්‍රවර්ධන ඒකකය,
6 වන මහල, නාගරික සංවර්ධන අධිකාරිය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

www.facebook.com/uda.gov.lk
www.uda.gov.lk